# ජල අංශ සංවර්ධන ව්‍යාපෘතිය II - 2012
--------------------------------------------

## 1. මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන
--------------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය
-------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 2,603,014,783 ක් හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 5,101,547,169 ක් විය. සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් අයිතමය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | - | 1,135, 391 | 21,633,042 |
| පරිගණක උපාංග | 195,000 | 324,948 | 519,948 |
| කෙරීගෙන යන සිවිල් වැඩ | 2,486,921,183 | 1,464,923,879 | 4,806,560,758 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 115,898,600 | 66,056,364 | 272,833,421 |
| | **2,603,014,783** | **1,532,440,582** | **5,101,547,169** |

## 3. විගණන නිරීක්ෂණ

---

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුව රු. 23,891,846 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා පාරිතෝෂිත වෙන්කිරීම් ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරුවෙකු මඟින් ප්‍රසම්පාදනය කරන ලද දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු. මිලියන 1.8 ක් දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම් තබනවා වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි. තවද, වර්ෂය අවසානයේදී එම වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

### 3.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

---

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 28 දිනට හෝ ඊට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) ව්‍යාපෘති ගණුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් විගණනය කර නොතිබුණි.

(ඇ) ආදායම් නොමැති ජලය සඳහා වන ප්‍රධාන ජල සැලසුම් සංරචකය යටතේ ප්‍රසම්පාදනය කරන ලද වත්කම් සඳහා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 අරමුදල් උපයෝජනය

---

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුල දී අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුම අනුව ලබාදීමට එකඟ වූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | වර්ෂය තුළ | 2012 දෙසැම්බර් 31 දින දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජා.ජ ස.නි. | 8,388 | 7,989 | 1,755 | 1,681 | 2,702 | 3,952 |
| ශ්‍රී.ලං.ර | 2,458 | 2,341 | 430 | 374 | 750 | 986 |
| එකතුව | 10,846 | 10,330 | 2,185 | 2,055 | 3,452 | 4,938* |

*සමාලෝචිත වර්ෂය අවසානයේ ගෙවිය යුතු ගිණුම් ඇතුලත් නොකිරීම නිසා මෙම වාර්තාවේ 2 වන ඡේදයේ දක්වා ඇති සංඛ්‍යා සමඟ මෙම වටිනාකම් නොගැලපේ.

ඉහත සඳහන් කරන ලද තොරතුරු අනුව, ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ දින සිට 2012 දෙසැම්බර් 31 දිනට වසර 4 ½ ක් ඉකුත් වී තිබුණද ව්‍යාපෘතිය විසින් ප්‍රතිපාදන වලින් සියයට 32 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමනිසා, ඉදිරි කාලපරිච්ඡේදය සඳහා විස්තරාත්මක සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය විසින් සිදු කර නොමැති නිසා දීර්ඝ කරන ලද වසර 03 ක කාලපරිච්ඡේදයද ඇතුලත්ව ඉදිරි කාලපරිච්ඡේදය තුළ ප්‍රතිපාදිත අරමුදල් භාවිතය පිළිබඳ විගණනයේදී සැක සහිත විය.

## 4.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

ව්‍යාපෘති ක්‍රියාකාරකම් යළි උපලේඛන ගතකර තිබුණු අතර ව්‍යාපෘති කාලය 2015 නොවැම්බර් 12 දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය විසින් සකස් කළ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 66 ක් හා සියයට 44 ක් විය. කොන්ත්‍රාත් කළමනාකරණය සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත විස්තර කෙරේ.

(අ) දුර්වල කොන්ත්‍රාත් කළමනාකරණය හේතුවෙන් රු.මිලියන 1,185 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත කඳාන ජල පිරිපහදු යන්ත්‍රයේ ඉදිකිරීම් වැඩ වසර 3 කට වැඩි කාලයක් ප්‍රමාද වී ඇත. ඉදිකිරීම් වැඩ වල භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දින වන විටත් සියයට 86 ක පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කැස්බෑව, ජඹුරලිය, කුඹුක ප්‍රදේශ වල ඉදිකළ ජල කුළුණු වසර 3 කට වඩා නිෂ්ක්‍රීයව පැවතිණි.

(ආ) කොළඹ සිරිල් සී. පෙරේරා මාවතේ පිහිටා ඇති බෙදාහැරීමේ පද්ධතිය ප්‍රතිසංස්කරණය සඳහා යුපීවීසී/ඩීඅයි නල, උපාංග හා ඩීඅයි වැල්ව් සැපයීම් කර එළීම සඳහා කොන්ත්‍රාත්තුව 2012 අගෝස්තු 31 දිනට සම්පූර්ණ කර තිබුණද මාර්ගය යථාතත්වයට පත් කිරීම සඳහා කොළඹ

මහනගර සභාවේ තබන ලද රු.මිලියන 4.5 ක් වූ ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුව ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආපසු ලබා ගෙන නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණවත් ශ්‍රමය හා යන්ත්‍ර යොදා නොගැනීම සහ කොළඹ නගර සභා ප්‍රදේශයේ වැඩ කිරීමේ කාලයේ සීමාකම් හේතුවෙන් 2015 ජනවාරි 31 හා 2014 මාර්තු 31 දින පිළිවෙලින් වැඩ අවසන් කිරීමට නියමිත නැගෙනහිර/බටහිර කැස්බෑවෙහි බෙදාහැරීමේ පද්ධතිය සඳහා ජලනල හා උපාංග එලීමත් කොළඹ කලාප IV හී කිලෝමීටර 56.5 ක ජලනල නැවත යෙදීමේ ව්‍යාපෘති වල 2012 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 38 හා සියයට 48 ක අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

**4.3 මතභේදයට තුඩු දෙන කරුණු**

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිවයක් වශයෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරන අතර පරිපාලන කටයුතු සඳහා ව්‍යාපෘතිය ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණද ව්‍යාපෘතියෙන් සියයට 20 ක පොදුකාර්ය පිරිවැයක් අයකරනු ලබයි. එම නිසා මහ භාණ්ඩාගාරයෙන් ලද අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 14.9 ක පොදු කාර්යය පිරිවැයක් ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා කුළියට ගත් හොරණ කාර්යාලය වෙනුවෙන් රු. මිලියන 1 වටිනා තැන්පතුව, ව්‍යාපෘති කටයුතු වලට සම්බන්ධයක් නොමැති කටයුතු වෙනුවෙන් වූ අතර එය ව්‍යාපෘතියේ නැවත ලැබිය යුතු තැන්පතුවක් ලෙස සලකා තිබුණි.

(ඇ) ආදායම් නොමැති ජලය සඳහා වන ප්‍රධාන ජල සැලසුම් සංරචකය සම්බන්ධයෙන් සියළු තොරතුරු ලබාදීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය බැඳි සිටින නමුත් ව්‍යාපෘතිය විසින් සේවයේ යෙදවූ කොන්ත්‍රාත්කරුට ඩිජිටල් සිතියම් ලබා දීමට ව්‍යාපෘතියෙන් රු. මිලියන 4.3 ක් මණ්ඩලය අයකරගෙන තිබුණි.